# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම යටතේ බඳවා ගැනීම - 2026**

01. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින කළමනාකරණ සේවා නිලධාරි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 76 ක ප්‍රමාණයක් විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් **2026.06.26** දින දක්වා අයදුම්පත් කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2008.06.26 දිනට හෝ ඊට පෙර හා 1996.06.26 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) අයදුම්පත් කැඳවන අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු අතර, ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන නියමිත ආකෘතිය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

(ඊ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

I. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියලුම විෂයයන්ගෙන් එකවර සමත්ව තිබීම.

*සටහන* - **අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යය වේ.**

*සැලකිය යුතුයි* - **සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.06.26 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

3.1 මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්, **https://exams.psc.up.gov.lk/** වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස **2026.06.26** දින ප.ව 11.59 ට හෝ ඊට පෙර විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා අත්සන සහතික කර, **2026.07.03** දින හෝ ඊට පෙර "**ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

3.2 දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

3.3 එසේම, මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත. විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි තොරතුරු සහිත සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

3.4 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. සිංහලයෙන් හෝ දෙමළෙන් සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දී ඇති කොටස් පමණක් නිවැරදිව එම භාෂාවලින් සම්පූර්ණ කළ යුතුවේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) හෝ දැනුම් දෙනු ලැබේ.

3.5 අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතුය.

*සටහන* - **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.06.05 දින පෙ.ව 9.00 ට විවෘත වන අතර, 2026.06.26 දින ප.ව 11.59 ට අවසන් වේ.**

**04. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

**4.1 පළාත් රාජ්‍ය සේවයේ / මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :**

අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවෙකු තම අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

**4.2 රාජ්‍ය සේවයේ නොසිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු / පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**05.** **විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 1250/- කි.** මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**06.** මෙම තරග විභාගය උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්විය යුතු නගර පිළිබඳ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ඇත.

**07.** ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

08. (අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියම හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලටද අංක රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වසර පහක් (05) අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේනම් පත්කිරීම් බලධාරියා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඉ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ යුතුවේ.

09. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 2 - 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය **රු. 48,470 - 10 x 540- 11 x 630 -10 x 1010 - 10 x1,190 – රු. 82,800/-**ක් වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයෙහි උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

10. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරින්ට රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරියා යටත් විය යුතුය.

**11.** **දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම** දිස්ත්‍රික් නාමලේඛනය, උපලේඛනය - I ලෙස දක්වා ඇත. අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - I අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී නිවැරදිව සඳහන් කළ යුතුය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම්කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරනු ලැබේ.

III. විභාගයේදී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*සැලකිය යුතුයි* - **දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු ප්‍රමාණය වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතුවේ.**

(ආ) දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයකට වෙන්කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය -

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය;

*එසේ නැතහොත්*

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතුය;

*එසේ නැතහොත්*

III. ඔහු/ඇය නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

සටහන-

1. ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

   I. උප්පැන්න සහතිකය;

   II. ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්දහිමි නාමලේඛනය;

   III. ශිෂ්‍ය කාර්ය දර්ශනය.

2. යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේනම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමව්පියන් විසින් තම දෙමව්පියන් උපන් ස්ථානය සහ රජයේ , පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයක නිරතවන බව සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය).

3. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 11(ආ) හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරා ගත් පසු එය නැවත වෙනස් කළ නොහැක.

12. මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහල ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%)ලබා ගත යුතුවේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

සටහන - මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර **ආබාධිත නොවන අයෙකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.**

**13. විභාග පරිපාටිය :**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | පැය 2 1/2 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | පැය 01 |

(01) **භාෂා හැකියාව :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශගත කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කරන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(02) **අභියෝග්‍යතාවය:**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යානමය හැකියාවන් තර්කන ශක්තිය සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන :**

(ආ) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාවන් පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ. මෙම තරග විභාගය මඟින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් හතලිහක් 40% අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙන් පනහක් 50% වත් ලබා ගත යුතුය. තරග විභාගය සඳහා වෙන්කර ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

14. **විභාග කොන්දේසි :**

III. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

IV. විභාගය පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර ඊමේල් (Email) මගින් එවනු ලබන අතර, විභාගය සඳහා අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ පිළිබඳව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්සැප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින් ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත. ඒ අනුව වෙබ් අඩවියෙන් ප්‍රවේශ පත්‍රය භාගත කර ගෙන පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය විය යුතු ආකාරය නිවැරදිව සඳහන්කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතුවේ. තරග විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

V. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රය අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙක් තම අත්සන ආයතන ප්‍රධානියාගෙන් හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියකු, සාමදාන විනිශ්චයකාරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

VI. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**15. විභාගයට ඇතුළත් කර ගැනීම :**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ලත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය.

සටහන - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

16. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

(ඇ) විභාග ප්‍රතිඵල :

අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තැපෑලෙන් හෝ වෙබ් අඩවිය මඟින් සිදු කෙරෙනු ඇත.

**17. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

I. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගය අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසුව හෝ කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙලි වූවහොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොබලන අතර. මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට යටත් වේ.

18. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

19. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

20. මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දුරකථන අංක 0552222400, 0552231460 ඇමතීමෙන් ලබා ගත හැකිය.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්. ඒ. සෝමරත්න,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 මැයි මස 26 දින,
බදුල්ල,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය - I**

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |

**උපලේඛනය - II**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 22 | බදුල්ල | බදුල්ල | 01 |
| | | බණ්ඩාරවෙල | 02 |
| | | මහියංගනය | 03 |
| 23 | මොනරාගල | මොනරාගල | 04 |
| | | වැල්ලවාය | 05 |
| | | බිබිල | 06 |

06-01

**ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි**

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජුනි** | 2026.06.05 | සිකුරාදා | 2026.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.12 | සිකුරාදා | 2026.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.19 | සිකුරාදා | 2026.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.26 | සිකුරාදා | 2026.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.